සංචාරයක සටහන්

ගුරු භූමිකාව හා ගෝලයා 2

ඉන් පසු අප නැවතත් ඔස්ට්‍රේලියාවට පැමිණියේ වෂී 2011 වසරේදීය. මෙහි නොවැම්බර්, දෙසැම්බර් මාස ''සමර්'' සෘතුව බැවින් හිරු රැස් හොඳින් භූමියට පතිත වේ. නමුත් වඅකාශයේ ජලවාෂ්ප අඩු හෙයින් ඇත්තේ ශරීරයට සිසිල් දේශගුණයකි. ශ්‍රී ලංකාවේ මෙන් දහඩිය නොදමයි. අඳුරු ශීත දේශගුණයකට පසු මෙවැනි පැහැපත් තරමක උණුසුම් කාලයක් පැමිණි විට මුළු රටවැසියන් සියල්ලම පාහේ සැහැල්ලු අඳුමින් සැරසී කුමර කුමරියෝ මෙන් අති පැරණි හා නවීන වාහන වලට නැගී නගරයට ඇදේ. නාතහොත් ඉතා සංවිධානාත්මකව, භූමි කළමනාකාරිත්වයෙන් සකස් කර ඇති උද්‍යාන කරා ඇදේ. එහි අතරින් පතර ඉඳිකොට ඇති මස්, මාළු, එළවළු අර්ධව පුළුස්සා ගනු ලබන අති ආරක්ෂා සහිත ආවරණ උඳුන් (බබකිව් මැෂින්) රජයෙන්ම සකස් කර දී ඇත. ජනතාව පවුල් පිටින් උද්‍යාන කරා පැමිණ ළමුන් වැඩිහිටියන් එක්වී පදම් කර සූදානම් කර ගෙනෙන ලද ආහාර පුළුස්සා අනුභව කරමින් මද රහමෙර පානය කරමින්, ක්‍රීඩා කරමින්, අල්ලාප සල්ලාපයෙහි යෙදෙමින් ඔවුන්ගේ ආතති මුදා හරිති. සැදෑභාගය ආසන්න වන විට එම පරිසරය තිබුණාටත් වඩා පවිත්‍ර කොට ඉතා සාමකාමීව නිවෙස් කරා යති. ගර්මකලාපීය, ලංකාව වැනි රටවල මිනිසුන්ට උගත හැකි ආදර්ශ බොහෝය. වාසනාවටදෝ මෙරට පදිංචිවී සිටින සිංහල පවුල්ද එම හොඳ ගති පැවතුම් අපුරුවට පිළිපදී. එසේ නොවුනහොත් රටේ නීතියෙන් ද භේදයකින් තොර සදා අමතක නොවන දඩ සංග්‍රහ බුක්ති විඳීමට ද ලැබේ. ලෝකයේ නගර අතර සහනශීලීව පදිංචි වී සිටීමට හැකි දෙවන නගරය ලෙස වික්ටෝරියා ප්‍රාන්තයේ මෙල්බන් නගරය වීම මීට කදිම ශාක්ෂියකි.

මෙවර මාගේ ගෝලයා වන කපිල චන්ද්‍රරත්න මා පදිංචි නිවසට පැමිණ අති සුන්දර ස්ථාන තුනකට රැගෙන ගියේය. එකක් නම් ''වෙරබි'' ප්‍රදේශයේ පිහිටි ''විවෘත සත්ත්ව උද්‍යාන'' යයි. අක්කර 100 ක් පමණ විශාල භූමි භාගයක පිහිටි මෙම ස්ථානය නැරඹීම සඳහා සංවිධානය කර තිබූ ආකාරය අති විශිෂ්ඨය. ඔස්ට්‍රේලියානු ජාතිකයන් සතු අනගිභවනීය කළමනාකරණයට අපේ රටකට වඩා කාන්දුවේදැයි සිතියවත් නොහැක. ඊට ඇතුල් වන විටම මට දැනුනේ දකුණු අප්‍රිකානු රටක සුප්‍රසිද්ධ වනජීවී අභය භූමියට ඇතුල් වූවා වැනි හැඟීමකි. ටිකට්පත් ගෙන ගස් වැල් වලින් මනාව ආවරණය වූ කොළපැහැති තෙරණක් බඳු ගොඩනැගිල්ලකින් ඇතුළු වූ අපව පළමුව ගෙන ගියේ අඩි 3 ක් පමණ උසුවූ ගනකම ලෑලි වලින් තනා තිබූ වේදිකාවක් මතටය. අපි එහි යන විට එරට ජ්‍යෙෂ්ඨ පුරවැසි සාමාජිකයින් සංවිධානය කරන ලද වයස අවුරුදු 70 ට වැඩි ඉතා පිරිසිදුව සැරසුනු පිරිසක් බස් රථයට ඇතුල් වෙමින් සිටියහ. පිරිමි සුදු මහතුන් ලා පැහැති කොට කලිසම් හා කමිස ඇඳ මේස් සමග කැන්වස් සපත්තු පැළඳ සිටි අතර කාන්තා පක්ෂය ද ශරීරයට සැහැල්ලු ඇඳුමින් සැරසී හිසට අලංකාර තොප්පි, ශිර්ෂ ආවරණ දවටා ඇතැමුන් ලස්සන සැරයටි ආධාරයෙන් ද කීප පොලක් රෝද පුටු වලින් ද බස් රථයට ඇතුළු වූහ.

බස් රථය පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතුමය. රථය වේදිකාවට පැමිණි පසු ඉදිරි හා පසු පස හැර දෙපැත්තේ ඇති ජනේල කවුළු වහලය සමග දෙපැත්තට බෙදී යන්ත්‍රානුසාරයෙන් බසය යටට ඇතුල්වේ. එවිට බසයට දෙපැත්ත හා වහලය සම්පූර්ණයෙන් විවෘත වන හෙයින් බසයට දෙපැත්තෙන් ඉතා පහසුවෙන් නැග ආසන වලට වාඩි විය හැක. බසයට සියල්ල ඇතුළු වූ පසු බසය බොඩියෙන් සම්පූර්ණව ආවරණය වේ. බසය ගුරුපාරක් දිගේ ගමන් අරඹයි. විස්තර ප්‍රදාරක තම කථනයද අරඹයි. සීබ්‍රා, පිරාෆ්, රයිනෝ හා විවිධ වර්ගයේ සව්පාවන් සැරිසරන රූස්ස ගස් හා තනපිටි සහිත කැලෑව මැදින් බස් රථය ඉදිරියට ඇදේ. දැන් අපට හැඟී යන්නේ ටැංසානියොවේ වියලි කාලගුණය සහිත අභය භූමියක් මැදින් ගමන් කරන්නාක් මෙනි. සැතපුම් 1 1/2 ක් පමණ සතුන් හා වනසිරි නරඹමින් ගමන් කළ බසය එක්තරා එළිමහන් ස්ථානයක නවතන ලදී.

එහි පිහිටා තිබුණේ අති දුෂ්කර වූ දකුණු අප්‍රිකානු ගෝත්‍ර සමාජයක අංගෝපාංග සහිත පුංචි ආදර්ශ ගමකි. නිවසේ වහළ ඉළුක් වැනි තෘණ වර්ගයකින් සෙවිල් කර තිබූ අතර, උස් නොවූ ගල් මිශ්‍රිත මැටියෙන් තනන ලද බිත්ති වලින් ආවරණය වී තිබුණි. නිවස තුළ ගෝත්‍රික පවුලක් මැටියෙන් අමා තිබූ අතර, ඔවුන් ගන්නා ආහාර පාන, භාවිතා කරන ගෝත්‍රික උපකරණ ප්‍රදර්ශනය කර තිබුණි. ඒ අසල වැටි තිබුණු අඳුරු අඩි පාරක් වැනි මාර්ගයකින් නුදුරු ස්ථානයකට එක්කරගෙන යනු ලැබීය. තරමක විශාල භූමි භාගයක වටේම ආවරණය පරිදි ගැඹුරු අගලක් විය. ඒ මැද අඩි 3 1/2 පමණ උස අඩි 6 1/2 පමණ දිග සද්ධන්ත අප්‍රිකානු සිංහයෝ එහි වූහ. නරඹන්නන් සිටියේ ඉතා ගණකම් වීදුරු වලින් තැනූ ආරක්ෂිත කාමරයකය. ඔවුන් අප ඉදිරියේ ඇති වීදුරු ආසන්නයටම පැමිණ ඉතා රොද්‍රව ගොරවමින්, මුඛය අවට ලෙව කමින් අපව ගොදුරක් කර ගැනීමට මාන බලමින් සිටියහ. තම ජීවිත කාලය තුළ එවැනි භයානක සතුන්ව වීදුරුව මතුපිටින් හෝ ස්පර්ශ කිරීමට එක් වරක් හෝ ලැබීමත් බීතිය ගෙන දෙන්නක් විය. ඉන් පසු විවිධ වන ජීවීන් නැරඹූ අපි ඉන් සමු ගත්තෙමු.

සුනිල් අබේසේකර
ආදි විද්‍යාර්ථී
කැළණිය විශ්ව විද්‍යාලය
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
(විශ්‍රාමික)

කපිල ඉන් සපු අපව රැගෙන ගියේ වරබි ප්‍රදේශයේ පිහිටි ''රෝස් ගාර්ඩන්'' විශාල රෝස මල් වත්තටයි. අක්කර 15 පමණ කදිම භූමි අලංකරණය කර තිබූ රෝස මල් වර්ග දහසක් පමණ විවිධාරයට සකස් කර වවා තිබුණි. මෙවන් රෝස වත්තක් පත පොතකවත්, රූපවාහිණියෙන්වත් අප කවදාවත් දැක නොතිබුණි. විවිධ වර්ණගත් මල් අතර කාල වර්ණ රෝස හා නෙළුම් වලක් පමණ විශාල රෝස වර්ග ද වූහ. රෝස පඳුරු කොළ නොපෙණෙන තරමට මල් වලින් පිරී සුවඳවත් වෙමින් තිබුණි. හෙලිකොප්ටරයකින් අහසට නැගි විට විවිධ රටා අනුව අලංකාරව රෝස පාත්ති භූගතව තිබෙන ආකාරය ප්‍රදර්ශනය වන බව ගෝලයා මා සමග පැවසීය. විශේෂිත රෝස පඳුරු හා මල් සඳහා බටහිර රටවල විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ රාජිණියන්ගේ නම් වලින් නම් කර තිබුණි.

ඉන් පසු අප පිටත්වූයේ ජීලෝන්හි නුදුරින් පිහිටි පසුගිය ලෝක යුධ සමයන්හි හා පැරණි අහස් යාත්‍රා ප්‍රදර්ශන අංගනයක් නැරඹීමටයි. විශාල යකට හා වානේ වලින් නිර්මිත වහලයකින් ආවරණය වූ අංගනයක් තුළ පිහිටා තිබුණි. මග පෙන්වන්නෙක් විසින්ම විස්තර ප්‍රචාරය ද ලබා දුන් අතර අහස් යානා තුල අහස් නියමුවන් ද නියම ස්වරූපයෙන් අඹා තිබුණි. අහස් යානා හා එහි ඇති යන්ත්‍ර වල ක්‍රියිකාරිත්වය හරස් කැපුමක් තුළින් මනාව ප්‍රදර්ශනය කරන ලදී. අහස් යානයක් අහස් ගතවන තාක්‍ෂණය, පැරෂුට් හා ප්‍රහාරකයානා ක්‍රියා කාරිත්වය පෙන්වා දෙන ලදී. දෙවන ලෝක යුද්ධයේදී භාවිතා කළ ප්‍රහාරක යානා රැසක් වූහ. අප සිත්ගත්, දෙදෙනෙක් පමණක් ගමන් කළ හැකි කුඩා යානාවක් විය. එය දෙවන ලෝක යුධ සමයේදී ඉන්ධන ලබා ගැනීම සඳහා එවකට ඉංග්‍රීසීන් යටතේ පැවති ලංකාවේ දකුණේ පිහිටි කටුකුරුන්ද ගුවන් තොටුපොලට බාන ලද බව එහි තිබෙන වර්ථාවල සටහන් කර ඇත. මෙම චාරිකාව ද අප දිවියේ අමතක නොවන ලෙස සනිටුහන් වී ඇත.

ඉන් පසු අපි තෙවෙනි වතාවට වෂී 2015 නොවැම්බර් මුල් සතියේ ඕස්ට්‍රේලියාවේ මාර්න්ඩා ගමට දරු මුණුපුරන් දැක නිවාඩුවක් ගත කිරීම සඳහා පැමිණයෙමු. මෙවර අප පිළිබඳ වෙහෙසෙන නිසා මාගේ ගෝල කපිලට දැනුම් නොදී පමිණුනත්, ඔහු කෙසේ හෝ අප පැමිණි බව දැනගෙන යුතුකම් ඉටු කිරීම වස් අප වෙනුවෙන් දිනක් ගත කිරීමට වෙන් කරන බව පැවසීය. ඒ අනුව දිනක් ඔහු බිරිඳත් දරු දෙදෙනාත් සමඟ පිමිණ අප දෙදෙනාව සැතැපුම් 175 කට වඩා ඈතින් පිහිටි ''බැන්ඩිගෝ'' නැමැති පැරණි ''රං ආකාර'' පිහිටි නගරයකට කැඳවාගෙන ගියේය. එහි වර්තා වලට අනුව පළමු රං ආකර හඳුනාගෙන ඇත්තේ වෂී 1851 බෙංඩිගෝ අවටිනි. ආකර 5600 ලියා පදිංචි කර තිබූ අතර කිලෝ ග්‍රෑම් ලක්ෂ 7 ක් රං නිෂ්පාදනය කර ඇත. නගර මධ්‍යයේ පිහිටි ''ඩෙබෝ'' 1939 සිට 1954 දක්වා රං නිෂ්පාදනය කර ඇත. අවුරුදු 15 ක් තුළ රං කි.ග්‍රෑ. 929 ක් නිපදවා ඇත. සේවය කළ පිරිස 375 දෙනෙකි. අක්කර කාලක පමණ භූමි භාගයක පිහිටි ගොඩනැගිලි දැව යකඩ වලින් නිර්මාණය කර ඇත. ආකර අඳුම් කාමරය, ප්‍රථමාධාර, ශීර්ෂ ආලෝක සිවි කිරීම, වඩුවැඩ, මැනේජර් කාමරය, යකඩ කම්හල, එන්ජින් කාමරය, කෞතුකාගාරය සඳහා කාමරද වේ. ඉතා ආරක්ෂා සහිත ඇඳුම් ලාගෙන ශීර්ෂ ආලෝක සවි කර ගෙන මග පෙන්වන්නා සමඟ බින්ගෙයට ඇතුල් වේ. ''බිංගෙය'' මීටර් 410 ගැඹුරය. පොළොව යටින් හරහට දිවෙන දෝනා 18 කි. අපගේ අත්දැකීම ගමන සංවිධානය වී තිබුණේ ලෙවල් 2 දෝනාවේ පිහිටි රන් ආකරය වෙතය. එහි ගැඹුර මීටර් 60 ත් 85 ත් අතර මිනිත්තු 75 ක පමණ ගමනකි. අඩි 10 උසට හා අඩි 6 පමණ පහළට දෝනා හාරා තිබුණි. ආකරයේ ගල් පිටතට ගැනීම සඳහා යෙදූ කුඩා රේල් පීලි අතර තෙත් වූ බිමක ඉදිරියට ඇදුනි. දෝනා අතර ගමන් කරද්දී ගණ කළුගල් අතර තෙරපුන තිරිවානා ගල් පටි දක්නට ලැබුනි. ඒ තිරිවාන ගල් අතර රං ඉතා සුළු පමාණ වශයෙන් තැන්පත්වී තිබෙන අයුරු අපි දුටුවෙමු. එන් අවුන්සයක් ලබා ගැනීමට රන් ඉල්ලමක් ඇති තැනකින් තිරිවාන හොන්ඩර් ගණනාවක් ගැරීමට සිදුවන බව විස්තර විනි.

රන් ආකරය නරඹා මතු පිටට පැමිණි පසු ඒ ඉදිරියෙන්ම නවතා තිබුණේ ඉතා හොඳින් පුණුරුත්ථාපනය කර තිබූ පැරණි ''බෙන්ඩිගෝ ගෝල්ඩ් වයින්ඩ්'' ට්‍රෑම් රථ සේවයයි. එය ''කථා කරන ට්‍රෑමය'' යනුවෙන් ප්‍රසිද්ධය. නොමිලේ ධාවනය වූ මෙය පැරණි නගර මධ්‍යයේ පිහිටි උද්‍යාන, ප්‍රතිමා, පැරණි සුවිසල් තැපැල් කාර්යාලය, කෞතුකාගාරය, පල්ලි, පොකුණු, නව නගර ශාලාව, හෝටල් යනාදී වෂී 1800-1940 ගණන් දක්වා තනන ලද පැරනි ස්ථාන පිළිබඳ විස්තර කථනයක් දෙමින් අපව රැගෙන ගොස් පැයක පමණ නගර සංචාරයකින් පසු ආරම්භක ස්ථානයට පැමිණේ. රන් ආකරය නැරඹීමට එක් අයෙකුගෙන් රු. 5000/- වැය විය. එනම් ඩොලර් 50 කි. යමක් පූණරුත්ථාපනය කර ඉතාමත් ආරක්ෂා සහිතව හා සංවිධානාත්මකව නැරඹීම සඳහා ඉදිරිපත් කිරීමේ හැකියාව මෙයින් ද සනාථ විය.

ඉන් බැන්ඩිගෝ සිට පැයක් පමණ දුර ගමන් කළ පසු සුවිංනල ගොවි පොල වතු අතරින් වියලි වන රොදකට අවතීර්ණය වුනෙමු. එක්වරම අඩියක් පමණ වටප්‍රමාණය ඇති සිංහල අක්ෂර වලින් ''ආයුබෝවන්'' යනුවෙන් දක්වා තිබූ දැන්වීම දැක අතිශය සතුටට පත්වීමු. විවෘත ස්ථානයක සිංහලෙන් ප්‍රදර්ශිත ඕස්ට්‍රේලියාවේ මා දුටු එකම දැන්වීම එයයි. ඊට නුදුරින් ''ග්‍රේට් ස්ථූප'' (මහා ස්ථූපය) යනුවෙන් ඉංගීසි පුවරුව දුටිමි. බැලු බැල්මට සාමාන්‍ය කඳු හා පල්ලම් සහිත අක්කර 50 ක පමණ වියලි ගසින් සමන් විත කැලෑ ප්‍රදේශයකි. නැවතුම් පොලෙහි රිය නවතා වර්ග අඩි 40 ■ 80 ක පමණ ඉඩ ප්‍රමාණයක් ඇති වයු සමීකරණය කරන ලද ශාලාවකට ඇතුළු වීමු. එහිදී සිවුරු පැළඳගෙන සිටි වයස අවුරුදු 65 ක පමණ සුදු ජාතික මෙණේන් වහන්නේ නමක් අපව පිළිගත් අතර වයස අවුරුදු 20 පමණ සුදු ජාතික තරුණයෙක් අපන පසෙක වාඩි කර මිනින්තු 40 ක් පමණ වීඩියෝ දර්ශන ඉදිරිපත් කරන ලදී. එහිදී මෙම භූමි භාගය පරිත්‍යාග කළ ඕස්ට්‍රේලියානු ජාතික යුවළ පිළිබඳත්, මෙහි ආරම්භය ටබෙට් රටේ බෞද්ධාගම අතර ඇති සම්බන්ධය, ස්ථානයේ ආරම්භය නුදුරින් ඉදිවෙමින් පවතින ''මහා ස්ථූපය'' පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කෙරිනි.

අනතනුරුව කුඩා ශාලාවක අපව ඇතුල් කළ අතර එහි මධ්‍යයේ ඇති අප කවර දිනකවත් දැක නැති බුදුන් වහන්සේගේ, අග්‍ර ශ්‍රාවක හා රහතුන් වහන්සේලාගේ ධාතු එකතුවක් තනැපත් කර තිබුණි. එම ශාලාවේ අප සමග දෙතුන් දෙනෙකුට වඩා නොසිටි බැවින් ආසන්න වී ඉතා නඳහස්ව කැමති වේලාවක් එම ධාතුන් වහන්සේලා වන්දනා කර ගත හැකි විය. බුරුම, චීන, මොන්ගෝලියන්, තායිලන්ත, ටිබෙට්, වියට්නාමය වැනි රටවලින් මෙම පූජනීය ධාතු එක්රැස් කරගත් බව වාර්තාවේ.

භූමියේ තරමක් උස් ස්ථානයක මීටර් 50 උසට හා මීටර් 50 ක් පළලට අත්තිවාරම හතරැස් හැඩයන් පිටතට පන්නන පරිදි, ටිබෙට් රටේ පිහිටා ඇති ලෝක ප්‍රසිද්ධ මහා ස්ථූපයේ ප්‍රමාණයට තට්ටු හතක් වන පරිදි ගොඩනැගීම අරඹා ඇත. දැනටමත් තට්ටු පහක් පමණ උසට ගොඩනගා ඇති හතරැස් හැඩතල ගන්නා ස්ථූපය ඇතුළත 500 ක පිරිසක් වාඩි වී සිටිය හැකි පරිදි ශාලාවක ඉඩකඩ සපුරා ඇත. ඇතුළතින් සෑම තට්ටුවක් වටේට ගමන් කළ හැකි පරිදි වේදිකා සකසා ඇත. මෙහි වටිනා බෞද්ධ පුස්තකාලයක් ද සැකසීම සැලසුම් කර ඇත. එහි හය වන තට්ටුවේ පූජනීය සර්වඥ ධාතු තැන්පත් වේ. ''ජේඩ්'' වර්ගයේ මැණික් වලට සමාන කළ හැකි තද කොළ පැහැති අඩි 4 ක් පමණ උසැති පද්මාසන ඉරියව්වෙන් ඇති බුද්ධ රූපයකි. එය ද එහි තැන්පත් වේ. මහා ස්ථූපය ඉදිරිපිට පිහිටි අක්කර 2 ක පමණ භූමි භාගයක ''බෝ'' වැනි පූජණීය ගස් වර්ග සිටුවීම ආරම්භ කර ඇත. මෙය ටිබෙටියන් ලාමා වරුන්ගේ පංසලක් වූවත් ඕනෑම බෞද්ධ නිකායකට පොදු බව දක්වා ඇත. වටිනා චාරිකාවක් අවසන් කර අපි නිවසට පැමිණ සියල්ල එකතු වී රාත්‍රී ආහාරය ගෙන ගෝලයෙකුට ගුරුවරයකුගෙන් ලැබෙන සියළු ආශිර්වාද ලැබ, චාම් ගති පැවතුම් ඇති, ප්‍රඥාවන්ත බව කරා ගමන් කරන ඒ සංස්කෘතික පවුල අපෙන් සමුගත්හ.

සන්නස මංගල යෝජනා

මුල් වචන 40 සඳහා මාසයකට අයකිරීම ඩොලර් 30
පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර එම ලදු පත සමග ඔබේ දැන්වීම අපට එවන්න
sannasanews@gmail.com

Account Name - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847